## මානව මහිම -3

# රූපවාහිනිය

බ්‍රිතාන්‍ය විශ්වකෝෂය රූපවාහිනිය අර්ථ දක්වා ඇත්තේ ඉලෙක්ට්‍රොනික ක්‍රමයකට රූප සම්ප්‍රේෂණය කළ හැකි උපකරණය ලෙසිනි.

### ඇරඹුණේ කොහොම ද?

1844 දී පාවුල් තවුකොම් නම් ජර්මන් ජාතික විද්‍යාඥයා සර්පිලාකාර හැඩ සිදුරු සහිත භ්‍රමණ රවුමක උපකාරයෙන් රූප සම්ප්‍රේෂණය කළ හැකි බව පෙන්වා දෙන ලදී

### රූප නළය

1900 දී රූප නළය(picture tube)නිපදවන ලද අතර ඉලෙක්ට්‍රොනික සම්ප්‍රේෂණ ක්‍රම වර්ධනය ද සිදු විය.

### ජෝන් ලොගී බෙයාර්ඩ්

ස්කොට් ජාතික ජෝන් ලොගී බෙයාර්ඩ් 1926 දී ලොව ප්‍රථම රූපවාහිනිය බිහි කළේ ය. 1932 දී රේඩියෝ කෝපරේෂන් ඔෆ් ඇමරිකා සමාගම විසින් සම්පූර්ණයෙන් ම ඉලෙක්ට්‍රොනික වූ රූපවාහිනියක් සාද එහි ක්‍රියාව ප්‍රදර්ශනය කරන ලදී. මෙහිදී අයිකොනොස්කෝප්(Iconoscope) නම් කැමරා නාලය යොදා ගැනිණි.

ලොව ප්‍රථම රූපවාහිනිය බිහි කළ බෙයාර්ඩ් හට සිය නිපැයුමෙන් ආර්ථික වාසි විශාල ලෙස ලබා ගැනීමට සමත් වූවේ නැත. ඔහුගේ නිපැයුම් අනුකරණය කරමින් මාර්කෝනි ඊ.එම්.අයි ආයතනය නිපදවූ රූපවාහිනී තාක්ෂණය බී.බී.සී ය විසින් පිළිගැනීම නිසා 1936 දී ඔහු මේ තරගයෙන් ඉවත් විය.

### නව ආයෝජන

රූපවාහිනී යන්ත්‍රය සඳහා වූ ඉල්ලුම වැඩිවීමත් ඒ ගැන සිදුවූ පර්යේෂණ මෙන්ම ආයෝජන ද වැඩිවන්නට විය. 1936 දී රේඩියෝ ඔලිම්පියා සමාගම ද තරගයට එක් වූවේ ය. 1954 තරම්වන විට සුළු මාධ්‍යම පංතිකයන්ට පවා රූපවාහිනී යන්ත්‍රයක් මිලදී ගැනීමට හැකිවන තත්ත්වයක් උදා විය. වර්ණ රූපවාහිනී ක්‍රමය ලොවට හඳුන්වා ලෙස ලද්දේ ද 50 දශකයේදී ය.

### අධිරූපන තාක්ෂණය

දැනට භාවිත වන තාක්ෂණික උපක්‍රමය වන පැතලි තිරය වෙනුවට කැතෝඩ කිරණ නළය රූපවාහිනියට හඳුන්වා දීම විශාල ජයග්‍රහණයකි. දැනට අප භාවිත කරන සාදෘශ්‍ය හෙවත් ප්‍රතිසම තාක්ෂණයට වඩා ඉදිරි පියවරකි අධිරූපන රූපවාහිනිය සංඛ්‍යාංක(Digital)ක්‍රමයට වාර්තා කිරීමෙන් රූප ප්‍රක්ෂේපණය කිරීම මෙහිදී සිදු වේ.

### රූපවාහිනී පෙරළියේ අභිත රහස්

රූපවාහිනී තාක්ෂණය(Digital television broad Casiting)යනු ඔබ සිතන තරම් නව නිර්මාණයක් නොවේ. එය නව "තාක්ෂණික ප්‍රබෝධයේ" තවත් එක් සුළු පියවරක් පමණි.

කෙසේ නමුත් මේ නව රූපවාහිනී ක්‍රමය අප රටේ නව නොබෝ දිනකින් සම්ප්‍රාප්ත වීමත් සමගම අප විසිත්ත කාමරය ඇතුළේ තබාගෙන ආදරයෙන් සුරකින "පවුලේ හිතවතා" වැනි වූ වත්මන් රූපවාහිනී යන්ත්‍ර එනම්PAL, UHF, VHF Betamaxආදී නම් වලින් හැඳින්වෙන තාක්ෂණික ක්‍රම අනුව බිහි වී ඇති රූපවාහිනී යන්ත්‍ර සහ වීඩියෝ යන්ත්‍ර අකමැත්තෙන් වුවද විසිකර දැමීමට සිදු වනු ඇත. එනම් දැනට භාවිත වන තාක්ෂණික උපක්‍රමය වන තල (පැතලි) තිරය වෙනුවට කැතෝඩ කිරණ නළය අප රූපවාහිනියට හඳුන්වාදීම මේ නව තාක්ෂණික පෙරළියේ ජයග්‍රහණය යි. ❑

**මනෝජ්**

**චිත්‍ර - කුසල ජයරත්න**



ජෝන් ලොගී බෙයාර්ඩ්



පළමු රූපවාහිනියේ ආදර්ශයකි

